# කාර්ය පත්‍රිකාව


**1.** පන්තිය : **8 ශ්‍රේණිය** විෂය : **විද්‍යාව** අදාල සතිය : **04 සතිය මාර්තු**

**2.** ඒකකය : **04** **පදාර්ථයේ ගුණ**

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්:**

I. විද්‍යාව පෙළ පොතේ 04 පාඩම හොඳින් කියවා තේරුම් ගන්න.

ii. ද්‍රව්‍ය 2 ක තාප සන්නායකතාව පරීක්ෂා කිරීම සඳහා සකස් කළ ඇටවුම පහතින් දැක්වේ. එක හා සමාන දිගින් හා හරස්කඩින් යුත් ද්‍රව්‍ය 2 සමාන පරතර සහිතව ඉටිවලින් ඇණ සම්බන්ධ කර දාහකය මඟින් රත් කරනු ලැබේ.




i. A හොඳ තාප සන්නායකයක් නම් මෙහි දී දැකිය හැකි නිරීක්ෂණ ලියන්න.

ii. B දුර්වල තාප සන්නායකයක් නම් දක්නට ලැබෙන නිරීක්ෂණ ලියන්න.

iii. ඉහත ද්‍රව්‍ය 2 සඳහා සපයා තිබුණේ ඇලුමිනියම් හා වීදුරු කූරක් නම් A විය හැක්කේ කුමක්ද?

iv. තාප සන්නායකතාව එදිනෙදා ජීවිතයේ දී ප්‍රයෝජනයට ගන්නා අවස්ථා 2ක් ලියන්න.

**4.** ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත් පත්, **websites, LMS** පාඩම් හා වෙනත් ඉගෙනුම් ආධාරක **(online, offline, printed)** :

I. **e -නැණපියස:**

- https://drive.google.com/file/d/1JCTvnKHLm3scLv7vQtPTTHWT_u7ikoO2/view
- https://wordwall.net/play/18233/662/901

II. **e- තක්සලාව :**

- https://www.ethaksalawa.moe.gov.lk/moodle/course/view.php?id=123&lang=si
- https://www.ethaksalawa.moe.gov.lk/moodle/mod/hvp/view.php?id=43669

III. **You tube :**

- https://youtu.be/mznTMnGz6MM
- https://www.youtube.com/watch?v=V5fRJzVec4Y

**5. මෙම සතිය තුල නියමිත පාඩම් වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :**

i. දෛනික ජීවිතයේදී ක්‍රියාකාරකම් සඳහා ද්‍රව්‍ය වල භෞතික ගුණ ප්‍රයෝජනවත් වන බව පිළිගනී.

ii. හැඩය හා පරිමාව ඝන ,ද්‍රව, වායු වල භෞතික ගුණ දෙකක් ලෙස පැහැදිලි කරයි.

iii. විවිධ ද්‍රව්‍ය විවිධ භෞතික ගුණ වලින් යුතු බව විස්තර කරයි.

6. **ඇගයීම් / තක්සේරුකරණ ක්‍රමවේදය** :

i. හිස්තැන් වලට ගැලපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

- අවකාශයේ ඉඩක් ගන්නා ස්කන්ධයක් ඇති ද්‍රව්‍ය .................... නම් වේ.

- පදාර්ථය අංශු වලින් සැදී තිබීමත් එම අංශු අතර අවකාශ පැවතීමත් පදාර්ථයේ ...................... ලෙස හැඳින්වේ.
- අංශු අතර ඉඩ ප්‍රමාණය අධික බැවින් .....................පහසුවෙන් සම්පීඩනය කළ හැක.
- ඝනයක් ද්‍රව බවට පත් වන නිශ්චිත උෂ්ණත්වය අදාළ ද්‍රව්‍යයේ ................ නම් වේ.
- යම් ද්‍රව්‍යයක ඒකක පරිමාවක සිකන්ධය එම ද්‍රව්‍යයේ ..................නම් වේ.
- ගැටුන විට රැව් දෙන හඬක් ඇත්තේ ..................වලය.
- භෞතික හෝ .................. ක්‍රම මගින් තවදුරටත් වෙනස් ගුණ ඇති ද්‍රව්‍ය වලට වෙන් කළ නොහැකි නිශ්චිත ගුණ දරන සංශුද්ධ ද්‍රව්‍ය .........................නම් වේ.
- සංඝටක දෙකක් හෝ වැඩි ගණනක් අඩංගු පදාර්ථ .................ද්‍රව්‍ය ලෙස හැඳින්වේ.
- ස්වයංක්‍රිය විද්ුත් පාලකයක් තැනීමේදී ලෝහ වල .....................උපයෝගී කර ගනී.

(ද්‍රවාංකය/ පදාර්ථ/ ප්‍රසාරණතාව/ තාපාංකය/ සංශුද්ධ නොවන/ ඝනත්වය/ රසායනික/ ඝන/ වායු/ අසන්තත ස්වභාවය/ ලෝහ/අලෝහ/ මූලද්‍රව්‍ය)